# දුම්බර ගල්පර මැඬියාට සංචාරකයින්ගෙන් හානි

**සජීව චාමිකර**
**පරිසර සංරක්ෂණ භාරය**

සංවර්ධන සැලැසුම්, වනජීවී සංරක්ෂණ සැලැසුම් පමණක් නො ව සංචාරක සැලැසුම් සකස් කළ යුතු වන්නේ ඒ පිළිබඳ ව නිපුණතාවයක් හා පුළුල් දැනුමක් සහිත පුද්ගලයන් ය. එසේ නොමැති ව හිතුමතේ එක් අරමුණක් මත පදනම් ව සකස් කරන සැලැසුම් හේතුවෙන් ඉතා හානිකර ප්‍රතිඵල අත් විය හැකි ය.

එවන් අතිශය හානිකර සැලැසුමක් මත පදනම් ව ක්‍රියාත්මක වන හානිකර සංචාරක වැඩපිළිවෙළක් දුම්බර අඩවියේ පිටවල පතන ප්‍රදේශයේ අද වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සැලැසුම සකස් කර ක්‍රියාත්මක කරන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වීම කනගාටුවට කරුණකි. පිටවල පතන ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විශාල සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් මේ වන විට සකස් කැරෙමින් පවතී. මෙය අහිතකර සැලැසුමක් වන්නේ මන් දැ යි කෙනකුට ප්‍රශ්නයක් මතු විය හැකි ය. එසේ වන්නේ මුළු ලොවින් ම දුම්බර අඩවියේ පිටවල පතන ඇතුළු ව ස්ථාන කිහිපයකට පමණක් සීමා වී ඇති දුම්බර ගල්පර මැඬියන් වඳ වීමට මේ තොරතුරු මධ්‍යස්ථානය හේතුවක් විය හැකි නිසා ය. ඒ අත්කිසිවක් නිසා නො ව තොරතුරු මධ්‍යස්ථානය ඉදි වීමත් සමඟ ම සංචාරකයන් ගේ ගැවැසීම ඒ ප්‍රදේශයේ වැඩි වන නිසා ය.

දුම්බර ගල්පර මැඬියා පිටවල පතනේ කුඩා ගල්පර අතර තෙත් පරිසරයේ සැඟ වී ජීවත් වේ. මේ ප්‍රදේශයේ සංචාරකයන් ගේ ක්‍රියාකාරීත්වය වැඩි වන තරමට ඒ සතුන් ගේ පැවැත්මට බාධා එල්ල වේ. මේ ස්ථානයේ සංචාරක ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට එම ස්ථානයේ ඉදි කැරෙන තොරතුරු මධ්‍යස්ථානය හේතුවක් වේ. එවන් ස්ථානයක සංචාරකයන් යොමු වීම වැඩි වන විට, දුම්බර ගල්පර මැඬියා ගේ වාසස්ථාන දැඩි තර්ජනයට ලක් විය හැකි ය. එබැවින් මේ තොරතුරු මධ්‍යස්ථානය සකස් කළ යුතු ව තිබුණේ මෙබඳු සුවිශේෂී සත්ත්ව වාසස්ථානයක් මඟහැරීමෙනි. එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තේරුම් නොගැනීම කනගාටුවට කරුණකි.

අප මේ පිළිබඳ ව පෙන්වා දුන්නේ අද ඊයේ නො වේ. දැනට වසර ගණනාවකට පෙර ජන මාධ්‍යවල පිටවල පතනේ හා කුඩා ලෝකාන්තයේ සුන්දරත්වය පමණක් පෙන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස පිටවල පතන පුරා ම සංචාරකයන් ගමන් කිරීම ආරම්භ විය. ඉන් දුම්බර ගල්පර මැඬියා දැඩි තර්ජනයකට ලක් විය. ඒ පිළිබඳ ව අදාළ අංශ දැනුම්වත් කළ පසු ව පිටවල පතන හරහා කුඩා ලෝකාන්තය නැරඹීමට යන මාර්ගය සලකුණු කිරීම සිදු කර පතන පුරා සංචාරකයින් ගමන් කිරීම සීමා කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පියවර ගත්තේ ය. එහෙත් ටික කලක් යන විට එය අමතක ව ගොස් අද වන විට පිටවල පතන සංචාරකයන් ගේ රජදහනක් බවට පත් ව තිබේ. ඒ තත්ත්වය තවදුරටත් දෙගුණ තෙගුණ වන්නේ මේ ස්ථානයේ තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීමත් සමඟ ම සංචාරකයන් රැඳී සිටීම වැඩි වන නිසා ය.

අද වන විට අප ගේ නිරීක්ෂණ අනුව පෙනී ගොස් ඇත්තේ පිටවල පතන පුරා පිහිටි දුම්බර ගල්පර මැඬියා ගේ වාසස්ථාන විශාල වශයෙන් විනාශ වී ඇති බව ය. විශේෂයෙන් ගල්පර මැඬියා වෙසෙන ගල්පර, කුමන හෝ පිරිසක් විසින් ඉවත් කරනු ලැබ ඇත.

ලංකාවට ආවේණික නැනෝප්‍රිස් (*Nannophrys*) ගණයට අයත් දුම්බර ගල්පර මැඬියා, කීර්තිසිංහ ගේ ගල්පර මැඬියා ලෙසත්, දුම්බර ගල්පර දිය මැඬියා ලෙසත් හැඳින් වේ. ඉංග්‍රීසියෙන් Kirtisingheh’s Rock Frog ලෙස හා Marble Rock Frog ලෙස ද හැඳින් වේ. මේ විශේෂය විද්‍යාත්මක ව නම් කර ඇත්තේ *Nannophrys mamorata* ලෙස ය. පරාක්‍රම කීර්තිසිංහ මහතා 1946 වසරේ දී මේ විශේෂය විද්‍යා ලොවට හඳුන්වා දී තිබේ.

දුම්බර ගල්පර මැඬියා දිගින් (හොම්බේ සිට ජම්බාලිය ප්‍රදේශය දක්වා දිග) මිලිමීටර 30 - 50 ත් අතර වේ. ගැහැනු සතුන් ප්‍රමාණයෙන් විශාලවන අතර, පිරිමි සත්තු ප්‍රමාණයෙන් කුඩා වෙති. පෘෂ්ඨෝදරීය ව පැතලි ශරීරයක් දරයි. හිස පුළුල් හා දිගු වන අතර හොම්බ චක්‍රාකාර ස්වභාවයක් ගනී. ශරීරයේ පෘෂ්ඨීය ප්‍රදේශයේ ඉන්නන් නො දරන අතර, සුමට ස්වභාවයකින් යුක්ත වේ. ශරීරයේ පාර්ශ්වික ප්‍රදේශයේ ඉන්නන් ව්‍යාප්ත වී ඇති අතර, ඒ ප්‍රදේශය රළු ස්වභාවයක් ගනී. ශරීර පසුබිම වර්ණ ඒකාකාර මඬ දුඹුරු පැහැය වන අතර, ශරීරය පුරා ම ළා දුඹුරු-ළා කහ පැහැයෙන් සිහින් ඉරි හැඩ විසිරුණු පුල්ලි අක්‍රමවත් ව ව්‍යාප්ත වී ඇත. උදරීය ප්‍රදේශය සුදු පැහැයෙන් යුක්ත ය.

මොවුන් ගේ ක්ෂුද්‍ර වාසස්ථානය තෙත් ස්වභාවය හොඳින් ඇති ගල්පරයන් ය. තෙත් ගල්පර මත මොවුහු බිත්තර දැමීම සිදු කරති. විශේෂත්වය වන්නේ බිත්තරවලින් පිටතට පැමිණෙන ඉස් ගෙඩියන් ද මවු සතුන් ආශ්‍රිත ව ම තෙත් ගල්පර මත දිවි ගෙවීම ය. මේ නිසා වැඩුණු සතුන් සිටින ස්ථානවල ඒ ආසන්නයේ ම ඉස්ගෙඩියන් ද විශාල වශයෙන් දැකගත හැකි ය. මොවුන් ගල්පර මත පිහිටි ගල් පතුරු යට සැඟැවී සිටීමට විශේෂ රුචියක් දක්වයි. එමඟින් දැඩි සූර්යාලෝකයෙන් බේරී සිටීමට හැකියාව ලැබේ.

දුම්බර ගල්පර මැඬියා වාර්තා වී ඇත්තේ මීටර 200 ත් 1220 ත් අතර උච්චත්වයකින් යුතු සීමිත ප්‍රදේශයකින් පමණි. එනම් ගම්මදූව, ලග්ගල, ගෝනවල හා පිටවල පතන ආදී ප්‍රදේශවලිනි. ඒ ප්‍රදේශවල ද මොවුන් යෝග්‍ය ක්ෂුද්‍ර වාසස්ථානවල පමණක් දක්නට ලැබේ. මින් පෙනීයන්නේ ස්වභාවිකව ම මේ විශේෂයේ ව්‍යාප්තිය සීමා වී ඇති බව යි.

2007 IUCN රතු දත්ත ලේඛනයට අනුව මේ විශේෂය වඳ වීමේ තර්ජනයට දැඩි ලෙස පාත්‍ර වූ (Critically Endangered) විශේෂයක් ලෙස දක්වා ඇත. විවිධ ජනමාධ්‍යවලින් නකල්ස් කඳුකරය විනෝද වීමට සුදුසු සුරංගනා ලෝකයක් ලෙස හුවා දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස, අද වන විට ඒ වෙත ඇදී යන සංචාරකයන් ගේ ප්‍රමාණය ඉතා අධික වී ඇත. හුදු විනෝදාස්වාදය පමණක් අරමුණු කර ගෙන මෙහි පැමිණෙන සංචාරකයන් නිසා මේ වන විට දුම්බර ගල්පර මැඬියා වඳ වීමේ එළිපත්තට ම පැමිණ සිටී. දුම්බර වනාන්තර පද්ධතියට අයත් පිටවල පතන ප්‍රදේශයේ පිහිටි කුඩා ලෝකාන්තය යැයි සලකන ප්‍රපාතය නැරඹීමට යෑම නකල්ස් කඳුකරයට පැමිණෙන බොහෝ දෙනා ගේ අරමුණ වී ඇත. ඒ ස්ථානයට ළඟාවීමට ඇති මාර්ගය තැනිතලා පතන භූමියකින් යුක්ත වේ. මේ පතන් බිමේ පිහිටි ගල්පර මත දුම්බර ගල්පර මැඬියා දැකගත හැකි ය. සංචාරකයන් මේ පතන් බිම පුරා ම ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ විශේෂයේ පැවැත්මට තර්ජන එල්ල වී තිබේ. තව ද මේ ස්ථානයට පැමිණෙන සංචාරකයන් මේ මැඬියා නැරඹීම සඳහා වරින්වර ඒ ගල්පර යට සිටින මැඬියන්ට බාධා කිරීම නිසා මොවුන් ගේ ස්වාභාවික ක්‍රියාවලියට බාධා එල්ල වී තිබේ. මේ ගල්පර මතින් සංචාරකයන් ගමන් කිරීමේ දී ද ගල්පර යට සැඟ වී සිටින සතුන් ගේ ජීවිතවලට හානි සිදු වේ.

මෙවැනි දෑ පිළිබඳ ව විධිමත් අධ්‍යයනයකින් තොර ව සංචාරකයන් හට නකල්ස් කඳුකරය පුරාම ගමන් කිරීමට අවස්ථාව සැලැසීමෙන් සිදුකර ඇත්තේ මහත් හානියකි. මෙවැනි ස්ථාන නැරඹීමට සංචාරකයන්ට අවස්ථාව ලබාදීමට ප්‍රථම විශේෂිත සතුන් ගේ වාසස්ථාන ඇති ප්‍රදේශ මඟ හැර සංචාරක සැලැසුම් සකස් කළ යුතු ව තිබිය දී ඒ පිළිබඳ අවධානය යොමු කර නොමැතිවීම විශාල අඩුපාඩුවකි. මෙවැනි ඉතා සංවේදී පරිසර පද්ධති සංචාරකයන්ට විවෘත කිරීමට ප්‍රථම ඒ සඳහා පවත්නා යෝග්‍යතාව ද, ජීවීන්ට හානි නොවන ලෙස නැරඹුම් මාර්ග සකස් කිරීම පිළිබඳ ව ද පුළුල් ව අධ්‍යයනය කළ යුතු ය. අධ්‍යයනයකින් තොර ව එවැනි ස්ථාන පිළිබඳ ව ජනමාධ්‍ය මගින් ප්‍රසිද්ධියක් ලබාදීමෙන් සිදුවන්නේ විශාල හානියකි.

මෙවැනි අති දුර්ලභ ජීවී විශේෂයන්ට සංචාරකයන් නිසා හානි සිදු වේ නම් එවැනි පරිසර සංචාරක කර්මාන්තයකින් රටට සිදුවන සෙතක් නම් නොමැත. විනෝදාස්වාදය සඳහා පමණක් පැමිණෙන සංචාරකයන් සඳහා වටිනා වනාන්තර පද්ධති බිලි දෙනවාද නැද්ද යන්න පිළිබඳ ව දැන්වත් අවබෝධ කර ගත යුතු ය.

අප රටේ ක්‍රියාත්මක පාරිසරික සංචාරක ප්‍රතිපත්තියේ ද මෙවැනි කරුණු පිළිබඳ ව සලකා බලා නොතිබීම විශාල පාඩුවකි. පාරිසරික සංචාරක කර්මාන්තය යනු ඒ සඳහා පිඹුරුපත් සකසන ආචාර්ය, මහාචාර්යවරුන් හා මහා පරිමාණ හෝටල් හිමියන් සිතනවාට වඩා පුළුල් දෙයකි. ඒ සඳහා දේශීය ජනතාව තව ම හුරු පුරුදු වී නොමැත. මේ සඳහා යොමු කිරීමට

ප්‍රථම ජනතාව ගේ ආකල්පීය හා චර්යා ධර්ම පද්ධතියේ පුළුල් වෙනසක් ඇති කළ යුතු ය. එසේ හුරු කිරීමක් නොමැති ව සංචාරකයන් ලෙස වනාන්තර තුළට කැඳවා ගෙන යෑමෙන් සිදු වන්නේ විශාල හානියකි. එපමණක් නො ව සංවේදී වනාන්තර පරිසර පද්ධතිවල සංචාරකයන්ට වෙන් කළ යුතු ස්ථාන පිළිබඳ ව ද පැහැදිලි කරුණු සංචාරක ප්‍රතිපත්තීන්ට ඇතුළත් වී නොමැත.

මුදල් ඉපැයීම පිළිබඳ ව පමණක් සිතන පාරිසරික සංචාරක කර්මාන්තයේ පුරෝගාමීන් ගෙන් අප ඉල්ලා සිටින්නේ මේ කර්මාන්තය නිසා සමස්ත පරිසර පද්ධතිවලට හා ජීවීන් ගේ විශේෂිත වාසස්ථානවලට මේ වන විට සිදු වී ඇති හානි පිළිබඳ ව පුළුල් ව සලකා බලන ලෙස ය. එය පදනම් කර ගෙන ඉදිරියේ දී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තය කුමන ආකාරයෙන් වෙනස් විය යුතු ද යන්න පිළිබඳ ව සලකා බැලිය යුතු ය. එසේ නොමැති ව ලෝක ප්‍රවණතාවට පමණක් මුල් තැන දී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කළ හොත් එය ලංකාවේ අද්විතීය ජෛව විවිධත්වයේ වඳවීමේ ශීඝ්‍රතාව දෙගුණ තෙගුණ කිරීමට හේතු විය හැකි ය.

දුම්බර ගල්පර මැඩියා



දුම්බර ගල්පර මැඩියා ගේ වාසස්ථාන



පිටවල පතනේ ඉදිකරන තොරතුරු මධ්‍යස්ථානය



පරිසර සංරක්ෂණ භාරය
අංක - 546/3, වට මාවත,
ගංගොඩවිල,
නුගේගොඩ.
දුරකථනය හා ෆැක්ස් - 011 2803139

**Environment Conservation Trust**